18

# ග්‍රීක පුරාණෝක්ති වස්තු විෂය කර ගත් කනෝවාගේ මූර්ති

*ආර්. කේ. පියුමි මහේෂිකා* [1]
HU/2011/0607

නව සම්භාව්‍යවාදයේ අරමුණු සාධනය කරනු වස් විශිෂ්ට දායකත්වයක් සැපයූ මූර්ති ශිල්පියෙකු ලෙස ඇන්ටෝනියෝ කනෝවාගේ මූර්ති පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. පැරණි සම්භාව්‍ය කලාවන්හි වූ අතිශය තාත්වික ශෛලිය අනුගමනය කරමින් ඔහු කළ මූර්ති බොහෝමයකට වස්තු විෂය වූයේ ග්‍රීක දේවමණ්ඩලය ඇසුරින් නිර්මිත ග්‍රීක පුරාණෝක්ති ය. මෙලෙස ග්‍රීක පුරාණෝක්ති ආශ්‍රයෙන් ඔහු කළ පළමු විශිෂ්ට නිර්මාණය වූයේ තීසියස් සහ මිනටෝර් (Theseus & the Minotaur) නම් මූර්තිය ය. ක්‍රීටයේ රජුට අයත් වංකගිරියක සිටි මිනටෝර් නම් වූ, ගව හිසක් සහ මිනිස් සිරුරක් සහිත සත්ත්වයා තීසියස් විසින් මරා දැමීමේ අවස්ථාව මින් නිරූපිත ය. විජයග්‍රාහී තීසියස් මිනටොර්ගේ ප්‍රාණය නිරුධ සිරුර මත හිඳ සිටින අයුරු මෙහි මූර්තිමත් කර ඇත. ඔහු විසින් මූර්තිමත් කරන ලද හෙරක්ලීස් සහ ලයිකාස් (Heracles & Lichas) මූර්තියෙන් ග්‍රීක වීරයෙකු වූ හර්කියුලිස් ඔහුගේ සගයා වන ලයිකාස්ව මුහුදට විසිකිරීම නිරූපිත ය. නව සම්භාව්‍යවාදී යුගයේ අග්‍ර කෘතියක් සේ සැලකෙන කියුපිඩ් විසින් සයිකිටනැවත ප්‍රාණය ලබාදීම (Psyche Revived by cupid’s kiss) දක්වෙන මූර්තියෙන් ග්‍රීක පුරාණොක්ති අතර ඉතා ප්‍රකට ප්‍රේම වෘත්තාන්තයක් නිරූපිතය. වීනස්ගේ පුත් කියුපිඩ් සිය ප්‍රේමවන්තියවූ සයිකිට නැවත ප්‍රණය ලබා දීම මින් නිරූපිත ය. හිබී (Hebe), මෙඩුසාගේ හිස අතැතිව සිටින පර්සියස් (Perseus with the Head of Medusa), ශ්‍රේස දෙවඟනන් (The Three Graces), එන්ඩිමියන් (Endymion), ඩයිඩලස් සහ ඉකාරස් (Daedalus & Icarus), තීසියස් සහ සෙන්ටෝර් (Theseus & The Centaur) ආදී ඔහුගේ බොහෝ මූර්ති ඔහු නිර්මාණය කර ඇත්තේ ග්‍රීක පුරාණෝක්ති ආශ්‍රයෙනි. මේ සියල්ල කිරිගරුඬ මාධ්‍යයෙන් කරන ලද මූර්ති විය. ග්‍රීක සම්භාව්‍ය යුගයේ හා හෙලනිස්ටික යුගයේ ලක්ෂණත් රෝමවරුන්ගේ පැවති අධිරාජ්‍යවාදී ස්වරූපය හා වීරත්වයත් මෙකී තේමාවලින් මැනවින් නිරූපණය කරනු පිණිස වූ ඔහුගේ ප්‍රයත්නය අතිශය සාර්ථක ය. මේ අනුව, නව සම්භාව්‍යවාදී යුගයේ අරමුණු සාක්ෂාත් කරනු වස් ග්‍රීක පුරාණෝක්තිවලින් බහුල වූ කනෝවාගේ තේමා භාවිතය වඩා සාඵල්‍ය බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ ප්‍රංශ විප්ලවය, නව සම්භාව්‍යවාදී යුගය, සම්භාව්‍ය කලාව, ග්‍රීක පුරාණෝක්ති

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) තෙවන වසර*